කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

*දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2016

අප්‍රේල්/ මැයි - 2022

**BMGTE 3025 - කුඩා ව්‍යාපාර කළමනාකරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : අටයි (08) කාලය : පැය 03 යි

**උපදෙස්**

- මෙම ප්‍රශ්න පත්‍රය **පළමු කොටස** හා **දෙවන කොටස** ලෙස කොටස් දෙකකින් සමන්විත වේ.
- එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරාගෙන මුළු **ප්‍රශ්න පහකට (05)** පිළිතුරු සැපයිය යුතුය.

**<u>පළමු කොටස</u>**

**ප්‍රශ්න අංක 01**

අ) පහත ප්‍රකාශ සමඟ ඔබ එකඟවන්නේදැයි දක්වා ඔබගේ පිළිතුර සැකෙවින් සාධාරණීය කරන්න.

i) ව්‍යවසායකයින් නිර්මාණය කළ හැකි අතර, ඔවුන් උපතින් බිහි නොවේ.

ii) ව්‍යවසායකයින් මූලිකවම අභිප්‍රේරණය වන්නේ මුදල් මඟිනි.

iii) ව්‍යවසායකයින් තරුණ හා ජව සම්පන්න විය යුතුමය.

iv) සාර්ථක ව්‍යවසායකත්වයේ ප්‍රමුඛ ලක්ෂණයක් වන්නේ ව්‍යාපාරයට ඇති දැඩි කැපවීමයි.

(ලකුණු 3 x 4 = ලකුණු 12)

ආ) ශ්‍රී ලංකාව තුල කුඩා හා මධ්‍ය ව්‍යාපාර වලින් රටෙහි සමාජීය හා ආර්ථික සංවර්ධනයට මනා පිටිවහලක් ලැබේ." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟවන්නේද? ඔබගේ පිළිතුර ශ්‍රී ලාංකික සන්දර්භය තුලින් උපුටාගත් උදාහරණ ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 02

අ) "පවතින වර්තමාන ප්‍රවණතා පිළිබඳ දැනුවත්වීම" සහ "ව්‍යවසායකයකුගේ ලක්ෂණ" යන යෙදුම් අතර සම්බන්ධතාවය කුමක්ද?

(ලකුණු 04)

ආ) විස්තරාත්මක සාධ්‍යතා අධ්‍යයනයක ප්‍රධාන කොටස් හතක් වේ. ඔබ නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සිත්නේ යැයි සලකා ඔබගේ නව ව්‍යාපාරයේ සාධ්‍යතාවය පහත අධ්‍යයන හතර හරහා සිදුකරන්නේ කෙසේදැයි කෙටියෙන් පහදන්න.

i) නෛතික හා ආයෝජන පරිසර අධ්‍යයනය.

ii) වෙළඳපල අධ්‍යයනය හා විශ්ලේෂණය.

iii) මූල්‍ය අධ්‍යයනය.

iv) මෙහෙයුම් සාධ්‍යතා අධ්‍යයනය

(ලකුණු 04 x 4 = ලකුණු 16)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 03

අ) පහත ප්‍රකාශ සමඟ ඔබ එකඟවන්නේදැයි දක්වා ඔබගේ පිළිතුර පිළිගතහැකි පැහැදිලි කිරීම් සමඟ සාධාරණීකරණය කරන්න.

i) ව්‍යාපාර සැලැස්ම ද්විත්ව ප්‍රයෝජන ලියවිල්ලක් වන අතර එය ව්‍යාපාරයේ අභ්‍යන්තර හා බාහිර යන දෙපාර්ශවයම භාවිතා කරයි.

ii) "වෙළඳපල තුල සිටින පාරිභෝගිකයන්ගේ හැසිරීම පිළිබඳ කටයුතු කිරීම වෙළඳපල විශ්ලේෂණයක කොටසක් ලෙස ඇතුලත් කිරීම අත්‍යවශ්‍ය නොවේ.

iii) කෙසේ ව්‍යාපාරය කටයුතු කරගෙන යන්නේද, එහි භාණ්ඩ හා සේවා කෙසේ නිෂ්පාදනය කරන්නේද යන්න මානව සම්පත් සැලසුම මඟින් පැහැදිලි කරයි.

iv) ව්‍යාපාර සැලැස්මක්, ව්‍යාපාර අදහස තුල ඇති දුර්වලතා හොඳින් ගවේෂණය කරන අතර, නව ව්‍යාපාර ආරම්භ කරන්නන්ට ව්‍යාපාරය පටන්ගත් පසු එම දුර්වලතා මඟහරවා ගන්නා ආකාරය ඒ තුලින් පෙන්නුම් කරයි.

(ලකුණු 05 x 4 = ලකුණු 20)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 04

අ) කර්මාන්තය හා කර්මාන්ත විශ්ලේෂණය අතර වෙනස කුමක්ද?

(ලකුණු 02)

ආ) කර්මාන්තය පිළිබඳ අධ්‍යයනය කරනවිට ව්‍යාපාර අදහසක් තුලින් ව්‍යාපාරයක් පටන් ගැනීමට ප්‍රථම අවධානය යොමුකල යුතු ප්‍රශ්න තුනකි. ඒවා කුමක්ද?

(ලකුණු 03)

ඇ) ඔබ නව ව්‍යාපාරයක් පටන්ගැනීමට යන්නේ යැයි සිතන්න. ඔබගේ නව ව්‍යාපාරය සඳහා කර්මාන්ත - තරඟකරුවන් විශ්ලේෂණය සිදුකිරීමට ඔබට යොදාගතහැකි ක්‍රම 03 පහදන්න.

(ලකුණු 15)

**(මුළු ලකුණු 20)**

## <u>දෙවන කොටස</u>

**ප්‍රශ්න අංක 05**

අ) ව්‍යවසායක සමාගම් විසින් භාවිතා කරන අලෙවිකරණ ක්‍රියාකාරකම්වල 4Ps (නිෂ්පාදනය, මිල, ප්‍රවර්ධනය සහ ස්ථානය) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ) වෙළඳ නාමයක් නිර්වචනය කර එය ව්‍යවසායක සමාගමක අලෙවිකරණ ප්‍රයත්නයන්ට වැදගත් වන්නේ මන්දැයි පැහැදිලි කරන්න. සැබෑ ලෝකයේ උදාහරණයකින් ඔබේ පිළිතුරට සහාය වන්න.

(ලකුණු 12)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 06

අ) සංවිධානයකට අනුගමනය කළ හැකි බාහිර වර්ධන උපාය මාර්ග හතරක් (04) කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

ආ) ව්‍යවසායක සමාගමක් භාවිතා කළ හැකි අභ්‍යන්තර නිෂ්පාදන වර්ධන උපාය මාර්ග තුනක් (03) විස්තර කරන්න. සෑම උපාය මාර්ගයක්ම විස්තර කිරීමේදී ප්‍රායෝගික උදාහරණයක් සමඟ සහාය විය යුතුය.

(ලකුණු 12)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 07**

අ) ව්‍යාපාරයක් පසුබෑමක් කරා වේගයෙන් වර්ධනය වන බවට අනතුරු ඇඟවීමේ සංඥා හතරක් (04) ලැයිස්තුගත කරන්න.

(ලකුණු 08)

ආ) ප්‍රායෝගික උදාහරණයක් සමඟ කුඩා ව්‍යාපාරයක් සඳහා වර්ධනයවීමේ අවශ්‍යතාවය ඉස්මතු කරන හේතු හයක් (06) කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 08**

අ) ව්‍යාපාර ආකෘතියක කොටස් ඇඳ විස්තර කරන්න.

(ලකුණු 08)

ආ) තෝරාගත් උදාහරණයකට අදාළ අගය දාමයක (value chain) කොටස් උද්දීපනය කරමින් සැබෑ ලෝක ව්‍යාපාරයක අගය දාමය විස්තර කරන්න.

(ලකුණු 12)

**(මුළු ලකුණු 20)**